# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීනී ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය විසින් 2024 මැයි මස 22 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 මැයි මස 13 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[261 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මෙම පනත විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත ලෙස හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව (මෙතැන් සිට මෙහි "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" ලෙසින් හඳුන්වනු ලබන) පහත සඳහන් පරිදි සංශෝධනය වන්නේ ය:-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ වගන්තිය සංශෝධනය කිරීම

(i) මෙම ව්‍යවස්ථාවේ දෙවන ඡේදයෙන් අනතුරුව වහාම පහත සඳහන් අතුරු විධානය ඇතුළත් කිරීම මගින්:-

"එසේ වුව ද, මෙම ව්‍යවස්ථාව යටතේ එක් එක් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් ඔවුන්ගේ ලැයිස්තුවට සියයට 50 කට නොඅඩු කාන්තා සාමාජිකයින් සංඛ්‍යාවක් ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.".

(ii) මෙම ව්‍යවස්ථාවේ තුන්වන ඡේදයෙන් අනතුරුව වහාම පහත සඳහන් අතුරු විධානය ඇතුළත් කිරීම මගින්:-

"එසේ වුව ද, එවැනි දේශපාලන පක්ෂයක් හෝ පාර්ලිමේන්තුවේ ස්වාධීන කණ්ඩායමක් නියෝජනය කිරීම සඳහා මෙම ව්‍යවස්ථාව යටතේ සියයට 50 කට නොඅඩු කාන්තා සභිකයින් සංඛ්‍යාවක් නම් කරන ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් එවැනි පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්වරයාගෙන් හෝ එවැනි ස්වාධීන කණ්ඩායමක කණ්ඩායම් නායකයා වෙතින් ඉල්ලා සිටිය යුතු ය.".

3. මෙම පනතේ සිංහල සහ දෙමළ අනුවාදයන් අතර යම් අනනුකූලතාවයක් ඇති වන අවස්ථාවන් හි දී සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූල වන අවස්ථාවක සිංහල අනුවාදය බලපැවැත්විය යුතු බව